# හඬක් ! හඬක් ! හඬක් !

## අසන්න

දයාබර පුතේ /සොහොයුරේ,

"දෑස් අරින්න, බලන්න මේ ලෝකය දෙස. අද ඔබ අවට වැඩියෙන් ම රජ කරන්නේ මනුෂ්‍යත්වයට වඩා පාපය නේද? මා දෙසූ දහම අද අමතක වෙලා. ඇතැම් අය තමන්ගේ ආත්මාර්ථකාමී ආශාවන්, ලාභ හා වාසි වෙනුවෙන් මනුෂ්‍යත්වය මරා දමලා. තන්හාවෙන් මුදල් හම්බ කරන්න ගස්වැල්, සතුන්, ඇළ දොළ, මහ මුහුද පවා විනාශ කරන්නේ හිතත් පපුවක් නැතිව වගේ. එපමණක් නොවේ බොහෝ මිනිසුන් හුදෙකලා වෙලා හඬනවා, වැලපෙනවා කියන්නට කෙනෙක් නැහැ. හඬක් නැති තරමට එයාලා ගොළුවෙලා. එහෙම නැතිනම් ගොළුකරලා. යුත්තිය නිහඬ කරලා අයුත්තියට පණ දෙන්න ඇතමුන් උත්සාහ කරනවා. පවුල් අවුල් වෙනවා. තරුණ අසහනය අහස උසට. ඔයාගේම වයසේ දරුවොත් ජීවිත ගැන හිතන්නේ කොහොමද කියලා අමුතුවෙන් කියන්න ඕනේ නැහැනේ. බොහෝ අය තමන්ගේ ජීවිතයේ වටිනාකම් මනින්නේ ලෞකික දේවලින්. හැබැයි මනුෂ්‍යත්වය දවසින් දවස හෑල්ලු වෙනාවා. අදත් මම මුළු ලෝකයට ම මෙසේ කියනවා.

*"වෙහෙසවන බර උසුලන සියල්ලෙනි මා වෙත එන්න, මම ඔබට සහනය දෙමි"* (ශු.මතෙව් 11:28)

මේ සුභ ආරංචිය නිවැරදිව දෙසන්නට,මගේ දහම ජීවත් කරවන්න එදා වගේම අදත් මට ශ්‍රාවකයින් අවශ්‍යයි. මා එදා ගලීලයේ මුහුද අද්දර දී තෝරාගත් ගෝලයන්ගේ අඩුපාඩු නොතිබුණා නොවේ. නමුත් මම ඔවුන්ව ධෛර්යවත් කළා.ශක්තිමත් කළා.යා යුතු ගමන පෙන්වලා දුන්නා.ශුද්ධාත්ම ආලෝකයෙන් පසුව ඔවුන් මා වගේම සුභ අස්න වෙනුවෙන් කැප වුනා , දුක් වින්දා.මුලු ජිවතයම පුජා කළා. ඒ නිසා නේද මුලු ලෙවම 'ජේසු' කියන්නේ කවුදැයි දැන ගත්තේ.

මතකද මා කීවා ''මමයි මාර්ගය, මමයි සත්‍යය, මමයි ජිවතය '' කියා ( ජොහාන් 14:6).ඉතින් පුතේ ,මා ගැන කියන්න එදා වගේම අදත් මට ශ්‍රාවකයෝ අවශ්‍යයි.මා සොයනා ශ්‍රාවකයා ඔබද?

දිළිදුන්ට සුභ ආරංචිය දේශනා කරන්න ඔබෙගේ හඬ මට අවශ්‍යයි.අධ්‍යාත්මික අන්ධභාවයට හසුවූ අයට පෙනීම දෙන්න ඔබගේ දෙනෙත් මට අවශ්‍යයි. පීඩිත,අසරණ,බෙලහීනයන්ගේ උදව්වට යවන්න ඔබගේ පාද මට අවශ්‍යයි. කොටින්ම කීවොත් මට ඔබව අවශ්‍යයි පුතේ

ඒ ලොවතුරා අදත් රැවුදෙන ජේසුගේ හඬයි ඔබටත් ඒ හඬ ඇසෙයි නම්, එකතුවන්න නිර්මල මරිය පැවදි හවුල සමගින්. පූජකයකු හෝ සහෝදරතුමකු වන්නට කරමි ඔබට ආරාධනා.

රොෂාන් ප්‍රනාන්දු නිමනි පියනම
දේව කැදවීම් අධ්‍යක්ෂක
නාසරෙත්
ශු එව්ජින් ද මැසනොද් මාවත
වෙන්නප්පුව
071 6828586

........................................................................මෙතනින් කපා හැකි ඉක්මණින් එවන්න........................................................................

ඔබේ නම:..............................................................................................................................................................

ලිපිනය:...............................................................................................................................................................

පාසැල:

ඉගෙනුම ලබන වසර:

ඔබ පියතුමෙකු හෝ සහෝදරතුමෙකු වීමට බලාපොරොත්තු වන්නේ ඇයි?:

ඔබය පැවදි ජීවිතයට ආසා වන්නට මඟ පෙන්නුවේ කවුද:

මීසම : මීසම් භාර පියතුමාගේ නම:

මම නිර්මල මරිය පැවදි නිකාය තුළ පියතුමෙක් / සහෝදරතුමෙක් (අනවශ්‍ය වචන කපා දමන්න) වන්නට බලාපොරොත්තු වෙමි.

දිනය: මෙයට,

දුරකතන අංකය: ක්‍රිස්තුන් වහන්සේට ලැදි දරු

.......................................

(අත්සන)